

මව්රට දැන් ඉරිදා
2026 ජූලි 12
හාට්
හදවත් හිරව්ච්චන් තැන...
HEART
Senasha Siriwardhana
Click by NEXUS Photography

# ශලනි අතින් හැඩවෙන ආදරණීය සිතුවම... ප්‍රේමියේ...

**සම්මාන රැසකින් පිදුම් ලැබූ ජනප්‍රිය රංගන ශිල්පිනී ශලනි තාරකා 'ප්‍රේමියේ' සිනමා නිර්මාණය සමගින් චිත්‍රපට අධ්‍යක්ෂණයට පිවිසෙන්නේ ඇය විසින්ම ලියූ තිර රචනයකට අනුව, තිර රචිකාවියක්ද වෙමිනි. මෙරට රංගනයේ යෙදෙමින් චිත්‍රපටයක් අධ්‍යක්ෂණය කළ හත්වැනි රංගන ශිල්පිනිය ලෙසටද 'ප්‍රේමියේ' සමගින් ඇය සිංහල සිනමා ඉතිහාසයට එක්වන්නීය. 'ප්‍රේමියේ' චිත්‍රපටයේ පූර්ව ප්‍රචාරක පටය, එහි ඇතුළත් ගීතයක් හා ප්‍රථම ප්‍රචාරක පෝස්ටරය එළිදැක්වීමේ උත්සවයක් පසුගියදා පැවැත්විණි.**

ගයනි අසිංසලා පියදිගම කතාව සහ පිටපත සැකසූ 'ප්‍රේමියේ' චිත්‍රපටයේ රංගනයෙන් ශලනි තාරකා, දනුක දිල්ෂාන්, දර්ශන් තවරාජා, අනුරාධ මල්ලවආරච්චි, නිරෝෂන් විජේසිංහ, කාවින්ද පෙරේරා, චතුර රාජපක්ෂ, දසුනි නවෝද්‍යා, සුහන්දි උපේත්මා, සචින්තනී කෞශල්‍යා, මීනා කුමාරි, විරාජ් පෙරේරා, නයෝමි පෙරේරා, උපතිස්ස බාලසූරිය, ශැගී වීරනායක ඇතුළු ජනප්‍රිය සහ ප්‍රවීණ රංගන ශිල්පීන් රැසක් එක්වී ඇත.

'ප්‍රේමියේ' නිෂ්පාදන නිර්මාණ සැලසුම්කරණයෙන් ශාන් ජයරත්න, විධායක නිෂ්පාදනයෙන් මෙවන් ලියනගේ, කැමරා අධ්‍යක්ෂණයෙන් සහ ආලෝකකරණයෙන් ඉන්දියානු ජාතික ගෝපි ජගදීශ්වරන්, සහාය අධ්‍යක්ෂණයෙන් තරිඳු ආරච්චිගේ, අංගරචනයෙන් නයන උජිත්, සංගීත අධ්‍යක්ෂණයෙන් ක්‍රිෂාන් කරුණාරත්න, සංස්කරණයෙන් සහ වර්ණ සංයෝජනයෙන් ශාන් අල්විස්, ශබ්ද සැලසුම්කරණයෙන් ශශින් ගිම්හාන් පෙරේරා, අමතර ශබ්ද නිර්මාණකරණයෙන් තනුෂ්ක කහඳවල, කලා අධ්‍යක්ෂණයෙන් ප්‍රසන්න කුමාරගේ, නිෂ්පාදන කළමනාකරණයෙන් ඩිලාන් රොෂාන්, ඇඳුම් නිර්මාණයෙන් සහ සැලසුම්කරණයෙන් රුෆෙලා ෆනැන්ඩො එක්වී සිටින 'ප්‍රේමියේ', ආචාර්ය මාලන් ප්‍රැන්සිස් පීටර්සේගේ නිෂ්පාදනයකි.








# ශෙහානි දෙන්නේ මාර සපෝට් එකක්... ඒක වචනවලින් කියන්න බැහැ...

ජෙනට් ඇන්තනී



**මේ දිනවල ජෙනට් ඇන්තනී කියන්නේ ප්‍රේක්ෂක ඔබ අතර ඉතා ජනප්‍රිය රංගන ශිල්පියෙක්. මෙවර සුමති සම්මාන උලෙළේ ජනප්‍රිය තරු අතරට එක්වෙන්නත් ඔහුට හැකියාව ලැබුණා. 'පට්ටි ගෙදර' ටෙලිනාට්‍යයේ උපාලි ලෙස ඉතා තාත්වික රංගනයක යෙදෙන ජෙනට්, 'බෝල්ට් ඇණයක්' ටෙලිනාට්‍යයේ ජාලියගේ චරිතයද ඉතා දක්ෂ අයුරින් නිරූපණය කරනවා. ඉතින් 'හාට්' අපේ අද කතාබහ ජනප්‍රිය රංගන ශිල්පී ජෙනට් ඇන්තනී සමගයි.**

**'පෝරකයක මඟුල් ගෙක්' සමග ජෙනට් මේ දිනවල කාලය ගතකරන බව ආරංචියි?**

චාලක රණසූරිය අධ්‍යක්ෂණය කරන, දිලූපා අල්විස් සහ ආශා ලොකුවඩුගේ නිෂ්පාදනය කරන 'පෝරකයක මඟුල් ගෙයක්' වේදිකා නාට්‍යයේ පුහුණුවීම් කටයුතු මේ දිනවල ඩිනක්ෂි ප්‍රියසාද්, කුසල් මදුරංග, චනුක සංදීප යන රංගන ශිල්පීන් කරගෙන යනවා. ඒ වැඩකටයුතු එක්ක තමයි මේ දවස්වල මගේ කාලය ගතවෙන්නේ.

**අපි ජාලිය ගැන කතාකරලම කතාවට මුලපුරමු?**

බෝල්ට් ඇණයක් ගැන කතා කළ යුතුමයි. ජාලියගේ චරිතය තමයි මම රඟපාන්නේ. පිටපත අතට ලැබුණට පස්සේ මට මුලින්ම දැනුණේ ජාලිය චරිතය හරිම ප්‍රවේසමෙන් කරන්න ඕනේ චරිතයක් කියලා. ලස්සනට ගලාගෙන යන කතන්දරයක් බෝල්ට් ඇණයක් පිටපතේ තියෙනවා. විශේෂයෙන් මතක් කරන්න ඕනේ මා සමග රංගනයෙන් දායක වන ශෙහානි කහඳවලගෙන් ලොකු සහායක් ලැබෙනවා ජාලියගේ චරිතය ගොඩනගා ගෙන යන්න. වචනවලින් කියන්න බැහැ ඒ සහාය. සියලු ශිල්පීන්, කාර්මික ශිල්පීන් දෙන සහාය නිසා තමයි මේ තරම් දුරට ජාලිය චරිතය ප්‍රේක්ෂකයන් අතරට ගිහින් තියෙන්නේ.

**ජාලිය චරිතය වෙනුවෙන් ඔබේ පැත්තෙන් මොන වගේ දේවල්ද එකතු කරගත්තේ?**

මගේ ගම දෙහිවල. මම සමාජයත් සමග ගනුදෙනු කරන කෙනෙක්. මට විවිධාකාර මිනිස්සු හමුවෙනවා. ඒ හරහා විවිධ චරිත මට හමුවෙනවා. ඒ දැකපු චරිත ඇතුළේ ජාලිය වගේ කෙනෙක් හිටියා. ඔහුත් එක්ක ඇසුරෙන් ලැබුණු අත්දැකීම් එක්ක ජාලිය චරිතයට අවතීර්ණ වෙන්න පුළුවන් වුණා. අනිත් දේ තමයි ජාලියගේ චරිතය මට වඩා ගොඩක් දුර වෙනස්ම චරිතයක්. ඒ නිසා පරිස්සමෙන් කරන්න වුණා. ජාලිය චරිතය ඇතුළේ ආදරය, දුක, හාස්‍යය මේ සියලු දේ මුසු වෙලා තියෙනවා. අපි කතාබහ කරන මිනිස්සුන්ට වඩා ජාලිය ගොඩක් වෙනස්. මට ටිකක් අමාරු වුණා ජාලිය ගොඩනගා ගන්න. ගොඩනැගුවට පස්සේ සුන්දර චරිතයක් වුණා ජාලියගේ චරිතය.

> ඒ දැකපු චරිත ඇතුළේ ජාලිය වගේ කෙනෙක් හිටියා.

**ඔබ සාමාන්‍යයෙන් චරිතය තුළදී අධ්‍යක්ෂවරුන්ට වඩ දෙන කෙනෙක් කියන්නේ ඇත්තද?**

මට චරිතයක් ලැබුණට පස්සේ මම ඒ චරිතය ගැන ගොඩක් අහන කෙනෙක්. මම නිරන්තරයෙන්ම හිතන දෙයක් තමයි අධ්‍යක්ෂවරයකු ඉන්නේ අපිට මග පෙන්වන්න කියන එක. අපි චරිතය සමග යන පාර හරියට පෙන්වන්න. අධ්‍යක්ෂවරයාට අනුව හැඩගැහෙන එක තමයි මම ගොඩක් කරන්නේ. අධ්‍යක්ෂට දැනෙන දේ චරිතය තුළින් ඔහු බලාපොරොත්තු වෙන දේ අවශ්‍ය විදියට මම ලබාදෙන්න කැමැතියි.


**'පට්ටි ගෙදර' උපාලි චරිතය හරහා ඔබේ රංගනයේ වෙනස්ම පැතිකඩක් දැකගන්න ලැබුණා?**

මාව පොළොවේ ගහලා කුඩුකරපු අධ්‍යක්ෂවරයෙක් ලෙස අනුෂ්ක රසාංජන හඳුන්වන්න පුළුවන්. රංගනය පැත්තෙන් මම හිතුවෙත් නැති පැතිකඩකට දාලා මාව කුඩුපට්ටම් කළා. උපාලි වගේ චරිතයක්, මට වඩා අවුරුදු 10ක් විතර වැඩිමල් චරිතයක් මම කවදාවත් හිතුවේ නැහැ මේ තරම් ඉක්මනට මට කරන්න ලැබෙයි කියලා. නමුත් අනුෂ්කට 'පට්ටි ගෙදර' පිටපත ලියද්දි මතක් වෙලා තියෙන්නේ මාව. ඔහු විශ්වාස කළා මාව ඒ චරිතයට ගැළපෙයි කියලා. ඒ විශ්වාසය තුළින්ම අනුෂ්ක, උපාලිගෙ චරිතය ගොඩනැගුවේ. ඔහු සමග වැඩ කරද්දි හරිම සුන්දරයි. අනුෂ්කට නිර්මාණ සම්බන්ධව හොඳ දැනුමක් තියෙනවා. ඒ හරහා තමයි උපාලි, නෝනා, නන්දනී ඇතුළු 'පට්ටි ගෙදර' ටෙලිනාට්‍යයේ චරිත ගොඩනැගුණේ.



**මෙවර සුමති සම්මාන උළෙලේ ජනප්‍රිය නළුවන් අතරට ඔබත් එකතු වී තිබෙනවා?**

අපිට චරිතයක් ලැබුණම ඒ වෙනුවෙන් මහන්සි වෙනවා. චරිතයට ලැබෙන්න





තියෙනවා නම් නිසි ඇගයීම ලැබෙයි. සම්මානයක් නොලැබුණත් කිසිම දුකක් නැහැ මට. මම කැමැති ලැබෙන චරිතයට ජීවය දෙන්න. ඒ චරිතය හොඳින් කරන්න තමයි මගේ අරමුණ. ලංකාවේ ගොඩක් දක්ෂ ශිල්පීන් ඉන්නවා. ඉතින් ඒ අතරින් සම්මානය කාට ලැබුණත් මගේ තියෙන්නේ නිහතමානී සතුටක්. සම්මානයක් කාට ලැබුණත් සතුටින් භාරගන්න ඕනේ. අපේම කාට හරිනෙ එය ලැබෙන්නේ.

**ලැබෙන ඕනම චරිතයක් භාර ගන්නවද? නැත්නම් තෝරාගැනීමක් කරනවද?**

මුල් කාලයේ එහෙම තෝරා බේරාගෙන චරිත කරන්න ලැබුණේ නැහැ. ලැබෙන චරිතය හොඳින් කරන එක තමයි මගේ අරමුණ. ලැබෙන චරිතයට වෙලාව අරගෙන කරන්න පුළුවන් මානසිකත්වයක් තියෙනවා නම් ඒ ලැබෙන චරිතය මම හොඳින් කරනවා.

**වසන්ත විතාරණගේ**



## මාව පොළොවේ ගහලා කුඩුකරලා දැම්මා...

---

## අවුරුදු 17යි කුලියාපිටියෙන් ඇවිත් ලංකාවට කිරුළක් ගේන්න හීන මවන හැඩකාරී...

## මේක මගේ පළමු අත්දැකීම... අම්මා තමයි ඇප්ලයි කළේ...



**මෙවර Ms Sri Lanka Earth 2026 ලෙසින් අභිෂේක ලැබුවේ ඇයයි. කුලියාපිටියෙන් ඇරඹි ඇගේ මේ සුන්දර ගමන, නිරූපණ ක්ෂේත්‍රයට පමණක් සීමා නොවී රංගනය, විලාසිතා නිර්මාණය මෙන්ම නීති ක්ෂේත්‍රය දක්වාම විහිදී යන්නකි. වයස අවුරුදු 17ක් වැනි බාල වියේදීම, තමන්ගේ පළමු පැජන්ට් අත්දැකීමෙන්ම තරගකාරීත්වයන් රැසක් පරදා ජයග්‍රහණයේ කිරුළ පැලඳි සෙනාශා සිරිවර්ධන, ඇගේ ඒ අපූර්ව අත්දැකීම සහ ජාත්‍යන්තරය දිනන්නට යන ඉදිරි බලාපොරොත්තු ගැන අප සමඟ මෙලෙස අදහස් දැක්වූවා.**

**ඔබේ විස්තර ටිකක් කියමු?**

මගේ නම සෙනාශා සිරිවර්ධන, මම ඉන්නෙ කුලියාපිටියේ. මට වයස අවුරුදු 17.

**මොඩ්ලින් ගැන මීට කලින් යම් හැදෑරීමක් සිදු කළාද?**

නැහැ. මේක තමයි මගේ පළමු අත්දැකීම. මම චරිත් සර්ගේ ක්ලාස් ගිහින් තියෙනවා. ඊට අමතරව පැජන්ට් එකක් වශයෙන් මේක තමයි පළමු අවස්ථාව. දැන් චරිත් සර්ගේ ක්ලාස් ගිහින් මොඩ්ලින් ගැන තවදුරටත් ඉදිරියට ඉගෙන ගන්නවා.

**මේ පැජන්ට් එකට ඇප්ලයි කළේ කොහොමද?**

මේකට මුලින්ම ඇප්ලයි කළේ මගේ අම්මා. එයා ඉන්ස්ටග්‍රෑම් එකේ ඩොක්ටර්ගේ පේජ් එකේ පෝස්ට් එක දැකලා ඒකට තමයි ඇප්ලයි කළේ.

**ගෙදරින් ලැබුණු සහයෝගය?**

ගෙදරින් අම්මා, තාත්තා, අයියා ඒ හැමෝගෙන්ම ලොකු සහයෝගයක් ලැබුණා මේ වැඩ පහසුවෙන් කරගන්න.

**පැජන්ට් එකේ අමතක නොවන සිදුවීම් මොනවද?**

ඩොක්ටර් අපි හැමෝටම තාත්තා කෙනෙක් වගේ හිටියා. අමතක නොවන සිදුවීමක් කියලා විශේෂ දෙයක් නෑ. හැම අවස්ථාවක්ම අමතක වෙන්නේ නෑ

**මේ ගමනේ ආපු බාධා මතකද?**

බධා කියන්නේ ළඟින් ඉඳලා කකුලෙන් අදින අය හිටියා. එයාලා ගැන දැනගෙන මේ ගමනේ ඉස්සරහට යනවා.

## ළඟින් ඉඳලා කකුලෙන් අදින අය හිටියා...

**දිනපු අවස්ථාවේ දැනුණු හැඟීම විස්තර කළොත්?**

ගොඩාක් තරගකාරියෝ හිටියා. ඒ හැමෝම අතරින් මට ජයග්‍රහණය කරන්න ලැබුණු එක ගැන මම සතුටු වෙනවා වගේම 26 දෙනෙක් අතරින් ජයග්‍රහණය කරන්න ලැබීම ගැන නිහතමානීව ආඩම්බර වෙනවා.

**ඉදිරියේදී ජාත්‍යන්තරව තරග වදින්න නියමිතයි. ඒක කොයි වගේ හැඟීමක්ද?**

සතුටුයි ඒ ගැන. ලංකාවට ක්‍රවුන් එක ගේන්න බලාපොරොත්තු වෙනවා.

**රංගනයට පිවිසෙන්න බලාපොරොත්තුවක් තියෙනවද?**

ඔව්. මීට කලින් ටීවී කමර්ෂල්, මියුසික් වීඩියෝ වගේ ඒවා කරලා තියෙනවා. මං රංගනය පැත්තට ගොඩක් ආසයි. ඉතින් ඒ පැත්තෙන් ඉදිරියට යන්න බලාපොරොත්තුවක් තියෙනවා.

**මේ ගමනට උදව් කරපු අයව මතක් කරමුද?**

අම්මා, තාත්තා, අයියා, නෑදෑයෝ, මගේ යාළුවෝ වගේම මේ පැජන්ට් එකේ හිටිය 26 දෙනාම ගොඩාක් උදව් කළා. ඒ වගේම අපේ ඩිරෙක්ටර් ඩොක්ටර් අසංක, චරිත් සර්, මලිති මිස් ඇතුළු පැජන්ට් එකේ හිටිය හැම කෙනෙක්ම ගොඩාක් උදව් කළා.

> පැජන්ට් එකේ හිටිය හැම කෙනෙක්ම ගොඩාක් උදව් කළා.

**ඉදිරි වැඩකටයුතු මොනවද?**

මොඩ්ලින් ක්ෂේත්‍රයට අමතරව රංගනය පැත්තෙන් ඉදිරියට යන්න බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මම ලෝ කරනවා. ෆැෂන් ඩිසයින් වගේම කැබින් කෲ යන්න බලාපොරොත්තුවක් තියෙනවා ඒ පිළිබඳවත් ඩිප්ලෝමාවක් කරනවා.

> හැමෝම අතරින් මම ජයග්‍රහණය කරපු එක ගැන සතුටු වෙනවා.





**කල්ප මේනක පීරිස්**



**අභිමානය කියන්නේ සිනමා සක්විති වෙන්න ලැබෙන එක නෙවෙයි...**

# ගැලරියෙන් විසිල් පාරක් හූරේ පාරක් එන එක තමයි නළුවෙක්ගේ අභිමානය...

**ජනිත් වික්‍රමගේ**

**ජනිත් කියන්නේ ප්‍රවීණ කලාකරුවන් දෙපළක වූ මානෙල් වානගුරුගේ සහ ආනන්ද වික්‍රමගේගේ වැඩිමහල් පුතා කියන එක නොදන්න කෙනෙක් ලංකාවේ නැහැ. ජනිත් නළුවෙක් වුණේ තමන්ම තනියෙන් පටන් ගත්ත ගමනක් හරහායි. කොහොමත් ඒ ගමන තුළ සිනමාවේ වාගෙම ටෙලි සිනමාව තුළත් නමක් තියන්න ඔහුට පුළුවන් වුණා. ඒ නම හරහා යම් ආකාරයක ප්‍රතිරූපයක් නිර්මාණය කරපු නිසා තමයි 'රැජිනියේ' ෆිල්ම් එකේ සිනමා සක්විති ගාමිණී ෆොන්සේකාගේ චරිත නිරූපණය සඳහා ජනිත්ව තෝරාගත්තේ. ඉමහත් ආන්දෝලනයකට තුඩුදී තිබෙන 'රැජිනියේ' චිත්‍රපට නිර්මාණය ගැනත්, ගාමිණී ෆොන්සේකාගේ චරිතයට ජනිත්ව තෝරාගැනීම ගැනත් තියෙන කසුකුසු බොහොමයි. ජනිත් වික්‍රමගේ ඒ ගැන මොනවද කියන්නේ? අන්න ඒ ප්‍රශ්නෙට උත්තරයක් හොයන්න සහ ජනිත් එක්ක ටිකක් කතාකරන්නයි මේ සූදානම් වෙන්නේ.**

**කොහොමද ජනිත් ඉතින් මේ දවස්වල ජීවිතේ?**

වරදක් නැහැ. ජීවිතේ ඔහේ සරලව ගලාගෙන යනවා.

**මේ දවස්වල කලා කටයුතු එහෙම කොහොමද?**

'රැජිනියේ' චිත්‍රපටයේ රූගතකිරීම් සමග තමයි මේ දවස්වල කාර්යබහුලව ඉන්නේ.

**ඔබ දිගින් දිගටම චිත්‍රපට කලාවේ නියැළෙන්න වගේ අදහස?**

තිරපිටපත හොඳ නම් චිත්‍රපටය වෙනුවෙන් ගිවිසුම් අස්සන් කරනවා. මම ආසයි සිනමාව තුළ මගේය කියන යම් ප්‍රතිරූපයක් ගොඩනගන්න. ඒ කියන්නේ චරිත හොයාගෙන යන්න හෝ ඒ පසුපස හඹායන්න පිපාසයක් තියෙනවා කියන එක නෙවෙයි. හොඳ චරිතයකට ආරාධනා ලැබුණොත් භාරගන්නවා.

**පසුගිය දවස්වල ඔබ චිත්‍රපට කිහිපයකටම රංගනයෙන් දායක වුණා?**

එහෙම ලොකුවට දායක වීමක් සිදුවුණේ නැහැ. 'ඒක තමයි මේක' සහ 'එදා රෑ' චිත්‍රපටවල ආරාධිත රංගනයන් සඳහා දායක වුණා.

**ඔබ ටෙලි රංගනයෙන් මඳකට ඈත් වුණා කියලා ආරංචියක් තියෙනවා?**

ඈත්වීමක් නම් සිදුවී නැහැ. නමුත් හැම ටෙලියකම රඟපාන්නේ නැතිව, හැමදාම ටීවී එකේ මූණ දාගන්න හෝ පේන්න ඕනෙ කියන මතය තුළ එල්බගන්නේ නැතිව හිතට දැනෙන කාටත් මතක හිටින චරිතයක් කරන්න ඕනේ කියන හැඟීම තුළ ඉන්නවා.

**මේ දවස්වල ඔබව පුංචි තිරයේ දකින්න නැත්තේ ඒ නිසාද?**

මගේ ජීවිතය තුළ මම අනුගමනය කරන යම් ක්‍රමයක් තියෙනවා. ඒ තමයි ඒකාකාරී බවෙන් මිදීමේ කැමැත්ත සහ යම් දෙයක් තුළ වෙහෙසට පත්වුණු මොහොතක ටිකක් විතර රිලැක්ස් වෙන්න ඕනෙ කියන සිතුවිල්ල තුළ ඉන්න එක.

හැමදාම ෂූටින් තියෙනකොට එක දිගට දවස් ගානක් ඒ වෙනුවෙන් කැපවෙනකොට මට හිතට වෙහෙසක් හෝ ඒකාකාරී බවක් දැනුණාම මම ටිකක් පැත්තකට වෙනවා. අන්න එතකොට ආයෙම එක පිට එක වගේ ටෙලියකට ආරාධනා ආවොත් රිජෙක්ට් කරනවා. පොඩ්ඩක් රිලැක්ස් වෙන්න ඕනෙ වුණාම ඒකට කාලය දෙනවා. බොහෝ විට මම රඟපාන ටෙලි ඩ්‍රාමා අවුරුද්දට එකක් හෝ දෙකක් වෙන්නේ ඒකයි.

**ඒ කියන්නේ ඔබ හැමදාමත් වැඩ තියෙන කාර්යබහුල නළුවෙක්?**

ඔව්. මම වාසනාවන්තයි. රංගනයට ආවේ 2006දී 'හිරිපොද වැස්ස' ෆිල්ම් එකෙන්. එතකොට මට අවුරුදු 17ක් වගේ ඇති. ෆස්ට් ෆිල්ම් එකම බොක්ස් ඔෆිස් එකක් වුණා. එදා ඉඳන් මම තවමත් රඟපානවා. රංගනයට ඇවිදින් මේ ගෙවෙන්නේ 20 වැනි අවුරුද්ද. දශක දෙකක්. ඒ වගේම ප්‍රේක්ෂකයන්ට මාව මතකයි. මගතොටකදී දැක්කම වුණත් ප්‍රතිචාර ආදරණීයයි. නළුවෙක් හැටියට තව මොනවද ඉතින්?

**අපි කතා කරමු ඊළඟට 'රැජිනියේ' ෆිල්ම් එක ගැන?**

මේ දවස්වල බොහෝ දෙනකුගේ කතාව ඒකනේ ඉතින්.

**ඔබ ඒ කළේ පුංචි පහේ සරදමක්ද ජනිත්?**

අයියෝ නැහැ. මොන සරදමක්ද? මම එහෙම කිව්වේ සෝෂල් මීඩියාවල පුවත්පත්වල හෙළ රැජිනිය මාලනී සෙනෙහෙලතා ෆොන්සේකාගේ චරිතය චිත්‍රපටයකට නගන එක ගැන සැරටම ප්‍රවෘත්ති පළවන නිසයි.

**ඔබට 'රැජිනියේ' ෆිල්ම් එකේ සුවිශේෂම චරිතය ලැබුණා?**

ඔව්. සිනමා සක්විති ගාමිණී ෆොන්සේකාගේ චරිතය මට ලැබුණා.

**හිතුවද කවදාවත් ඔහොම සුවිශේෂ චරිතයකට සම්මාදම් වෙන්න ලැබෙයි කියලා?**

ඔව් ඉතින්. නිළි රැජින මාලනී ෆොන්සේකා වෙනුවෙන් ෆිල්ම් එකක් හැදෙයි කියලාවත්, මහා නළු ගාමිණී ෆොන්සේකාගේ චරිතයට මට ආරාධනා කරයි කියලාවත් කිසිම ඉඟියක් කලින් දැනුණේ නැහැ.





**රැජිනියේ ආවාම අපි බලමු...**

**කලාව අප කාටත් පොදු දෙයක්. සමහරුන්ට නටන්න, ගයන්න, සිතුවම් අඳින්න පුළුවන්. තවත් සමහරුන්ට මූර්ති, කැටයම් කලාව පුළුවන්. මේ සියලු දක්ෂතාවන් ඔවුන් අරගෙන එන්නේ සහජයෙන්මයි. ඉතින් එවැනි දක්ෂතාවන් රැසක් ඉතා අපූරුවට පිහිටපු ශිල්පිනියක් සමගයි අද අපේ කතාබහ ඇරැඹෙන්නේ. ඇය නෙයි සාරා. පසුගියදා නිමාවට පත්වුණු 'වරකත' ටෙලිනාට්‍යයේ මාලා ඔබට මතක ඇති. ඇය මාලා චරිතයට පණපොවමින් ප්‍රේක්ෂක ආදරය දිනාගත්තා. අපි දැන් නෙයි සාරාගෙ කතාව අහමු.**

**මොනවද ඔබට දැනුණු හැඟීම ප්‍රවීණ නළු ගාමිණී ෆොන්සේකාගේ චරිතයට ආරාධනා කරනකොට?**

උපරිමයෙන්ම ඒ චරිත නිරූපණයට සාධාරණයක් කරනවාය කියන හැඟීම දැනුණා.

**ඔබට අභිමානයක් වැනි හැඟීමක් හිතට ආවේ නැද්ද?**

ගාමිණී ෆොන්සේකාගේ චරිතය ලැබෙනවද, මාලන් බ්‍රැන්ඩෝගේ චරිතය ලැබෙනවද කියන එක නෙවෙයි අභිමානය කියන්නේ. ලැබුණු ඒ කොයියම් හෝ චරිතයට නියම සාධාරණයක් කරන එකයි අභිමානය කියන්නේ.

**එය නිරූපණය කරන්න ලැබීම ඔබේ වාසනාව හෝ අභිමානය කියලයි කවුරුත් කියන්නේ?**

ඔව්. ඒ ඔවුන්ගේ මතය. මගේ මතය ඊට වෙනස්. ලැබුණු චරිතයට සාධාරණයක් කිරීම තුළ තමයි එහි අභිමානය මට ලැබෙන්නේ. එය ගැම්මට නොකළොත් මොන තරම් ප්‍රවීණයකු හෝ ගෞරවනීය පුද්ගලයකුගේ චරිතය මට ලැබුණත් එහි එලක් නැහැ.

**ඔබ එම චරිත නිරූපණයට සාධාරණයක් කරමින් සිටිනවද?**

මට ලැබෙන ඕනෑම වැඩක් මම මට හැකි උපරිමයෙන් කරනවා. හැබැයි මම සාර්ථකද කියලා තීරණය කරන්නේ ප්‍රේක්ෂකයායි. ගැලරියට අපි

# මිහිරි අයියා මාව මැටි ගොඩක් වගේ පදම් කළා...

## මුස්ලිම් කෙල්ලෙක් වෙලත් මට පල්ලියෙන් සපෝට් එක දුන්නා

## අවංකව ආදරය කරන පිරිමි අඩුයි...

## මගේ රඟපෑම බලන්න දැන් එයා නෑ...

**සාරා ඉතින් කොහොමද?**

හොඳින් ඉන්නවා. මේ දිනවල 'සිත නිදි නෑ' ටෙලිනාට්‍යය සමග කාලය ගතකරනවා. ඒ වගේම පසුගිය දිවස්වල නිර්මාණ කිහිපයකට සම්බන්ධ වුණා. මේ දවස්වල වේයන්ගොඩ ප්‍රේක්ෂක ජනතාවට රසවිඳින්න වේදිකා නාට්‍යයක් ගෙන එන්න මමයි මගේ යාළුවෙකුයි එකතු වෙලා සංවිධාන කටයුතු කරනවා.

**ඔබ මුලින්ම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වුණු විදිය ගැන කතා කළොත්?**

මම 2019 වර්ෂයේ නිරූපිකාවක් ලෙස තමයි මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්නේ. පැජන්ට් එකක් හරහා අවසන් 12 දෙනා අතරට මම තේරුණා. මම මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන්න හිතවලත් තිබුණේ නැහැ. වජිර විජේවර්ධන සර් ළඟ මම නිවේදන කටයුතු හැදෑරුවා. මම මුස්ලිම්. මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙන නිසා මට ගොඩක් හිතන්න වුණා. වජිර සර් තමයි මගේ දක්ෂතාව හඳුනාගෙන මට නිවේදනයට වඩා රංගනය පැත්තෙන් ඉදිරියට යන්න පුළුවන් කියලා කිව්වේ. ඉතින් අවුරුදු කිහිපයකට පසු රංගනයට පිවිසුණා.

**ඔබව ගොඩ දෙනෙක් හඳුනා ගත්තේ ලොකු නෝනා හරහා?**

ඔව්. 'කුජීත ෆිල්ම්ස්' යූටියුබ් නාලිකාවේ ලොකු නෝනා චරිතයට මට ගොඩක් දෙනෙක්ගේ ආදරය ලැබුණා.

**සාරාගේ ආගම, සංස්කෘතිය පැත්තෙන් ප්‍රශ්නයක් මතුවුණේ නැද්ද මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වීම නිසා?**

එහෙම කිසිම ප්‍රශ්නයක් ආවේ නැහැ. මිනුවන්ගොඩ මුස්ලිම් පල්ලියෙන් මට ලොකු සහායක් ලැබුණා. ඒ නිසා මගේ ගමනේ පාර ලස්සනට හදාගෙන හෙමිහිට මේ ගමන යනවා.

**'වරකත' ඒ ගමන් මගේ රසමුසු නවාතැන්පළක් වුණා?**

මගේ ජීවිතයේ සොඳුරුම නවාතැන්පළ තමයි 'වරකත' ටෙලිනාට්‍යයේ මාලා කියන චරිතය. මිහිර සිරිතිලක අයියට මම ගොඩක් ස්තුතිවන්ත වෙනවා මට මේ චරිතය සඳහා අවස්ථාව ලබාදුන්නට. මාලා චරිතයට මට පුළුවන් උපරිම සාධාරණයක් කළා කියලා මම හිතනවා. මැටි ගොඩක් පදම් කරලා හදනවා වගේ මිහිර අයියා මගේ හැම දේම හැදුවා. දෙබස් උච්චාරණයේදී මට පොඩි පොඩි වචන උච්චාරණය කරන්න අපහසුතාවක් තිබුණා. ඉසුරු අයියා, දමයන්ති අක්කා, නිරෝෂා අක්කා ඇතුළු මුළු කණ්ඩායමෙන් මට මාරම සපෝට් එකක් දුන්නේ. මාලා චරිතය මගේ වාසනාවට ලැබුණු චරිතයක්.

**මාලා වගේ ගොඩදෙනෙක්ට සමාජය තුළ සිදුවෙන්නේ අසාධාරණයක් නේද?**

ගැහැනියක් විදියට මම හිතනවා අවංකව ආදරය කරන පිරිමි හමුවෙනවා අඩුයි. ගොඩක් දුරට මිනිස්සු ආදරය කරන්නේ ලබාගන්න බැරි දේවල්වලට. මෙතැනදී මාලා වුණත් හිතන්නේ නැති කෙනකුට ආදරය කරනවා. මාලාට වලව්වේ හාමුගේ අවංක ආදරය ලැබෙනවා. සාමාන්‍ය ජීවිතයේ බොහෝ අය මාලා වගේ ආදරයකින් බැඳුණාම, ඇය මවක් වුණා කියලා දැනගත්තාම අත්හැරලා දානවා. ඒත් මාලාට ඒ අසාධාරණය නොවී ඔහුගේ සැමියා ලැබුණා. ඒ වෙලාවේ මට දැනුණේ ඒ දේ මට ලැබුණා වගේ හැඟීමක්. මාලා වගේ අය මේ රටේ ඕනෑ තරම් ඇති. ඒ වගේ අයට කිසිම අසාධාරණයක් නොවී අවංක ආදරයක් ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.

**ගොඩක් දුරට මිනිස්සු ආදරය කරන්නේ ලබාගන්න බැරි දේවල්වලට.**

**සාරාගේ ජීවිතයට සමාන ගති ලක්ෂණ මාලා චරිතය තුළ ඔබ අත්වින්දාද?**

මගේ ජීවිතයට සමානකම් තිබුණු විශේෂ අවස්ථා කිහිපයක් මාලා චරිත ස්වභාවය තුළ ගැබ්වෙලා තිබුණා. මම දෙදරු මවක්. මට දුවලා දෙන්නෙක් ඉන්නවා. මමත් තනිවෙලා ඉන්නේ. ඒ වගේම තමයි මාලාගේ ජීවිතයෙත් ප්‍රශ්න රැසකට ඇයට මුහුණ දෙන්න සිදුවුණු අවස්ථා තිබුණා. අම්මා කෙනෙක් විදියට මගේ ජීවිතයට මුහුණ දුන්න අවස්ථා තියෙනවා. මගේ ජීවිතයේ ඒ ලබපු අත්දැකීම් එකතු කරගෙන මම චරිතය හොඳට රඟපෑවා. චරිතය වෙනුවෙන් මගේ බාහිර ස්වරූපයවත් මම වෙනස් කළේ නැහැ.

**ඔබ කාලයක් මේ ක්ෂේත්‍රයෙන් දුරස් වීමට හේතුව?**

තාත්තාගේ මරණයෙන් පසු මම ගොඩක් මානසිකව වැටුණා. කලාව ගැන හිතන්න තරම්වත් මට මානසික මට්ටමක් තිබුණේ නැහැ. මගේ තාත්තා නොසිටින්න මම අද කලාවේ නැහැ. මගේ තාත්තා තමයි මම කරන්න කැමැති දේට පාර පෙන්නුවේ. මගේ අයියලා මගේ ගමනට විරුද්ධ වුණත් තාත්තා තමයි කිව්වේ 'මම බලාගන්නම් ඒ දේවල් කියලා.' මගේ ජීවිතයේ ශක්තිය තාත්තා. මට දැන් ලොකු දුකක් තියෙනවා මගේ මේ හොඳම කාලයේ මගේ රඟපෑම් දකින්න ඔහු ජීවතුන් අතර නැති එක ගැන. මට හිතෙනවා තාත්තා කොහේ හරි ඉඳගෙන මගේ දක්ෂතාව බලාගෙන ඇති කියලා.

**වසන්ත විතාරණගේ**



මාව බේරගත්තේ තාත්තා...





---

හොඳ දේ දුන්නොත් ඔවුන් සතුටු වෙනවා. හූරේ දානවා. අන්න එයයි නළුවෙකුගේ අභිමානය. 'රැජිනියේ' ආවාම අපි බලමු. ඔවුන්ගේ ප්‍රතිචාරය කොහොම වෙයිද කියලා.

**ඇතැමුන් චෝදනා කළා සිනමා සක්විති ගාමිණී ෆොන්සේකාට ඔබ මැච් වෙන්නේ නැහැ කියලා?**

ඒක ඒ ඒ අයගේ මතය. ඕනෑම අයෙකුට පුළුවන් තම තමන්ගේ මත ඉදිරිපත් කරන්න. ඒක මට අදාළ නැහැ.

**සමාජ මාධ්‍ය පුරා ප්‍රසිද්ධියේ චෝදනා මුදාහැරෙන විට ඔබට යම් චකිතයක් දැනුණේ නැතිද?**

මම එහෙම චකිතයට පත්විය යුතුය කියලා මම හිතන්නේ නැහැ. 'රැජිනියේ' නිර්මාණය ආරම්භ වූ දා සිටම විශාල ආන්දෝලනයක් ඇතිවුණා. හැබැයි ඔය හැමෝම කෑකෝ ගහන්නේ මේ නිර්මාණය කොහොම එකක්ද, මොන වගේ දෙයක්ද කියලා නොදැනයි. චෝදනා කරන්න හෝ ප්‍රශංසා කරන්න නිර්මාණය දකින්න ඕනෑ. රසවිඳින්න ඕනෑ. ඉන් පසුවයි විවේචනය කළ යුත්තේ. දැනට මේ සියලු දෙනාම කලබල වෙලා ඉන්නේ 'රැ ජිනියේ' මොන මට්ටමේද, මොන වගේ නිර්මාණයක්ද කියන එක නොදැනයි. ඉතින් ඒ නිසා ඔවුන් තමන්ට මනාප ඕනෑම මතයක් ඉදිරිපත් කළාට කමක් නැහැ.

**ඔබේ අම්මා ඒ චෝදනා හමුවේ දැඩි සිත් වේදනාවට පත්වූ බවයි දැනගන්න ලැබුණේ?**

සත්තකින්ම ඔව්. මට එල්ල කළ චෝදනා ගැන අම්මා දැඩිව කම්පා වුණා. චිත්‍රපටය තිරග වන්නට පළමුව කිසිවක් දකින්න පළමුව මේ විදියේ අනිසි චෝදනා කරන එක ඇගේ හිතට කලකිරීමක් කනගාටුවක් එක්කර තිබුණා. ඈ මගෙන් අවස්ථාව ඉල්ලුවා මේ ගැන සමාජ මාධ්‍යය ඔස්සේ පැහැදිලි කිරීමක් කරන්න. පසුව මමයි ඇයට කිව්වේ කලබල වෙන්න එපා, චිත්‍රපටය තිරගත වූ දාට කතා කරන්න ඕනේ දේ කතා කරමු කියලා.

**'රැජිනියේ' තිරගත වූ පසු ප්‍රේක්ෂකයා ඔබේ චරිත නිරූපණය ගැන හූරේ පාරක් දාවි කියලා ඔබට විශ්වාසද?**

තවම කොහොමද ඒ ගැන කියන්නේ? 'රැජිනියේ' තිරගත වූ දවසට ප්‍රතිචාරය කොහොම වෙයිද කියලා බලමු.

**මල්මි කෞෂල්‍යා**

# ගේට්ටුවාහි අමුතුම ගැටයක් ගහන කපටි මනාලි...

**ගුරු මාරුවක් හින්දා නගරයෙන් ගමට එන සුධර්මා ගහන අමුතු ගැටය ගැන අපි කාටවත් තවම හිතාගන්න බැරි තරම්. 'ගේට්ටුවා' ටෙලිනාට්‍යයේ සුධර්මා ලෙසින් ඔබ හමුවට එන වගීෂා ඉෂාන්ති සමගයි 'හාට්' අපේ මේ කතාබහ.**

**ටෙලිනාට්‍යය විකාශය වෙන්න ලොකු කාලයක් ගතවුණා.**

**මේ දවස්වල 'ගේට්ටුවා'හි සුධර්මා හරි ජනප්‍රියයි?**

සුධර්මා චරිතය ගැන තමයි මගතොටේදී හමුවෙන අය කතා කරන්නේ. ඇයි මේ තරම් කපටි කියලා අහනවා. මම ඉතින් ඒ වෙලාවට පොඩි හිනාවක් දාලා එයට ප්‍රතිචාර දක්වනවා.

**ඔබේ ආදරණීය සැමියාගේ නිෂ්පාදනයක් 'ගේට්ටුවා'?**

ඔව්. මගේ සැමියා තමයි මලිත් කුලතිලක. 'ගේට්ටුවා' ටෙලිනාට්‍යය අධ්‍යක්ෂණය කරන්නේ ලසිත කාරියවසම්. මට මගේ සැමියා හමුවෙන්නත් කලින් තමයි ඔහු 'ගේට්ටුවා' ටෙලිනාට්‍යය නිෂ්පාදනය කරලා තියෙන්නේ. ටෙලිනාට්‍යය විකාශය වෙන්න ලොකු කාලයක් ගතවුණා. ඉදිරියේදී තවත් නිර්මාණ දැකබලාගන්න පුළුවන්.

**ඔබේ ආදරණීය සැමියාගේ තේරීමක්ද සුධර්මා චරිතය?**

මම කවදාවත් මගේ සැමියා ටෙලිනාට්‍ය නිෂ්පාදනය කළා කියලා චරිත ඉල්ලගෙන රඟපාලා නැහැ. මට ගැළපෙන චරිතයක් තිබුණොත් ඔහු මට කතා කරනවා. සුධර්මා චරිතයට මම සම්බන්ධ වුණේ ටෙලිනාට්‍යයේ අධ්‍යක්ෂ ලසිත කාරියවසම්ගේ ආරාධනාවක් මතයි. රඟපෑවේ නැහැ කියලා මම සැමියාගේ නිර්මාණවලට උදව් නොකර ඉන්නේ නැහැ. මට පුළුවන් විදියට ඔහුගේ වැඩකටයුතුවලට උපරිම සහාය දෙනවා. මමත් කැමැති ඔහු මේ ක්ෂේත්‍රයේ වැඩකටයුතුවලට සම්බන්ධ වෙන එකටයි.

**වගීෂා මුලින්ම අපට දැකගන්න ලැබුණේ වෙළෙඳ දැන්වීම් හරහා?**

මම ටෙලිනාට්‍යවලට ලොකුවට සම්බන්ධ වුණේ නැහැ. මම මුල්ම කාලයේ නිරූපණ ක්ෂේත්‍රයේ තමයි වැඩ කළේ. 2018 ජාතික රූපවාහිනියේ අවුරුදු කුමරිය වුණා. මම ගොඩක්ම කැමැති වෙළෙඳ දැන්වීම්වලට තමයි. ප්‍රේක්ෂකයන් මගේ රංගනය හඳුනාගත්තේ 'වත්සුණු' ටෙලිනාට්‍යය හරහා.

**ටෙලිනාට්‍ය රංගනයට සම්බන්ධ වෙන්න ආරාධනා අඩුද?**

ආරාධනා අඩුවක් නැහැ. මට පුතෙක් ඉන්නවා. එයාට අවුරුදු 3යි. පුතාගේ කටයුතු වෙනුවෙන් තමයි මම මුළු කාලයම වෙන් කරලා තියෙන්නේ. ටෙලිනාට්‍ය සඳහා සම්බන්ධ වෙනවා අඩු ඒ නිසයි. 'ගේට්ටුවා' ටෙලිනාට්‍යයට මම ගියෙත් අපේම නිර්මාණයක් නිසයි.

**ගැළපෙන එකක් තිබ්බොත් කරනවා...**

වසන්ත විතාරණගේ





**මම මුල්ම කාලයේ නිරූපණ ක්ෂේත්‍රයේ තමයි වැඩ කළේ.**



**මුළු කාලයම වෙන්වෙලා තියෙන්නේ පුතාට...**

## විසාකේස චන්ද්‍රසේකරම්ගේ The Son and the Lover කෘතියට Gratiaen ත්‍යාගය...





Gratiaen Trust ආයතනය John Keells Foundation සමග එක්ව, City of Dreams Sri Lanka හි Cinnamon Life ys The Studio පරිශ්‍රයේ පැවැති සාහිත්‍ය විශිෂ්ටත්වය සමරන උත්සවයකදී 33 වැනි Gratiaen ත්‍යාගයේ ජයග්‍රාහකයා නිවේදනය කළේය. මෙවර වාර්තාගත නිර්මාණ සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබූ අතර, විසාකේස චන්ද්‍රසේකරම්ගේ The Son and the Lover කෘතිය එහි ජයග්‍රහණය හිමිකර ගත්තේය.

මෙවර අවසන් වටයට ඇලන් ඩි කොස්තා විසින් රචිත Dear Father, The Refugee, අනුත්තරා එකේලි විසින් රචිත God, Bangles and a Constitution, උවිනි අතුකෝරාළ විසින් රචිත In the Curve of the Smile සහ විසාකේස චන්ද්‍රසේකරම්ගේ The Son and the Lover කෘති තේරී පත්විය.

ප්‍රියන්ත හෙට්ටිගේ




# ඇගේ සයිස් එකට ග්‍රහයෝ දෙන ෂේප් එක මෙන්න...

## ලග්නෙ හැටියටද ලස්සන?

**මෙලොව උපදින සෑම ජන්මියකුගේම ශරීරයේ සහ ජීවිතයේ පැවැත්ම වගේම ඒ ඒ ශරීරාංගවල ක්‍රියාකාරීත්වයටත් විවිධ ග්‍රහ දේවතාවුන්ගේ ඇල්ම බැල්ම සහ බලපෑම යෙදෙන්නේය. ඒ අනුව පුද්ගලයකුගේ සිරුරේ හිස, බෙල්ල, ඇස්, අත්, පපුව, පියයුරු මේ ආදී සියලු අවයවයන්ට ප්‍රධානත්වය සහ ඒ ඒ අවයවයන්ගේ ක්‍රියාකාරීත්වයට වගකියන සහ ඊට දායක වන ග්‍රහ වස්තූන් තිබේ.**

ඒ අනුව ඒ ඒ ග්‍රහයන්ගේ සුබ අසුබ සහ බල දුබලකම් කොතරම් දුරට කෙනකුගේ උත්පත්ති තත්ත්වයට බලපා තිබේද යන කාරණය මත ඒ ඒ අයගේ රූපය පෙනුම වෙනස් වන බව හඳුනාගත හැකිය. එහිදී පුද්ගලයකුගේ ස්වභාවය ප්‍රධාන වශයෙන් ලග්නය, ලග්නාධිපති සහ යෝගකාරක ග්‍රහයා යන තිදෙනාගේ ප්‍රධානත්වය මත තීන්දු වන අවස්ථාත්, එසේ නැතහොත් යම් රාශියක ග්‍රහයන් තිදෙනකුට වැඩි ප්‍රමාණයක් සිටීම තුළ ඒ අනුවත් තීරණය වෙයි.

තවද යම් ජන්මියකුට තදබල ලෙස අශුභ දෘෂ්ටියක් යෙදෙන ග්‍රහයෙක් සිටියේ නම් එම ග්‍රහයාගේ බල පරාක්‍රමයට යටත් රූපකාය ශරීර කොටස යම් අසමාන ස්වභාවයකින්, විකෘති ස්වභාවයකින් හෝ අවලක්ෂණයකින් පිහිටයි.

මෙම ග්‍රහ තත්ත්වය අනුව කෙනකුගේ කේන්දරයේ සිටින ග්‍රහයන් තම බල දුබලකම් අනුව එම ජන්මියාගේ රූපයට දායක වේ. ඒ අනුව කෙනකුට ඉතා ලස්සන කඩවසම් රුවක් ලැබෙද්දී තවත් කෙනකුට අවලක්ෂණ පෙනුමක් සහිත ශරීරාංග ලැබීමත් සිදුවේ.

එමෙන්ම කෙනකු කෙට්ටු වෙද්දී තවත් කෙනකු හැඩට මහතට සිටින අවස්ථාත්, තවත් කෙනකුගේ සිරුර වයසටත් පෙර වැහැරේද, එම වයසත් පසුකළ පිරිස් ඉතා පිරිපුන් ලෙස සිරුර පවත්වාගෙන යන අයුරුත් දක්නට ලැබෙයි. මේ සියලු කාරණාවලට බලපානුයේ ග්‍රහයන්ගේ ක්‍රියාකාරීත්වයයි.

ඒ අනුව ඒ ඒ ජන්මීන්ගේ ශරීරාංගවල හැඩයට ප්‍රමාණයට සහ පිරිපුන් බවට බලපාන ග්‍රහ තත්ත්වයන් පහත පරිදි ජ්‍යොතිෂයේ සඳහන් වෙයි.

■ ග්‍රහයන් තදබල ලෙස දුර්වලව පිහිටි විටත්, 6,12,2 පාප ග්‍රහයන්ගේ පීඩාවලට ලක්වූ විටත් ශරීරයේ හැඩකාර බව ගිලිහීමට හේතු යෙදේ.

● කේන්දරයේ අයහපත් තැනක ඉතා අසුබ තත්ත්වයෙන් යුරේනස් පිහිටි විට සිරුරේ එක් කොටසක පිවරීත බව ඇතිකරවනු ඇත. ඒ අනුව කාන්තාවන්ගේ පියයුරු අසමබරභාවයට මෙය ප්‍රධාන සාධකයක් සේ පෙන්වා දිය හැකිය.

■ චන්ද්‍රයා, බුධ, ශනි ලග්න ස්ඵුටයට ආසන්නව සිටින විට කුජගෙන් අසුබ දෘෂ්ටි ලැබුයේ නම් එම ග්‍රහ තත්ත්වයෙන් උපන් අයගේ රහස් අවයවයන්ගේ අඩුපාඩු සහිත වනු ඇත. බොහෝදුරට මෙම තත්ත්වය පිරිමින්ගේ අවයව ලොකු කුඩා වීමට බලපාන බවටද හඳුනාගෙන ඇත.

■ 6,8,12 රාශි අධිපති පාප ග්‍රහයෝ කේන්ද්‍රගතව චන්ද්‍රයාට හා ලග්නාධිපතිට අශුභ දෘෂ්ටි සහ අශුභ සංයෝග යෙදෙන්නේ නම් සිරුර අවලස්සන වෙයි. තොල්වල, මුහුණේ, පියයුරුවල පෙනුම අඩු කරයි.

■ චන්ද්‍රයා කුජ සමග සංයෝගී වී සිටියදී රාහු කේතු 12 වැන්නේද, රවි ගුරු දෙදෙනා 4 වැන්නේද සිටියේ නම් කොන්ද සම්බන්ධ ආබාධ ඇතිකරයි.

■ ජල රාශියක් ලග්නය වී බල සහිතව උපන්නේ නම් ස්ථූල සිරුරක් උරුම වේ. මෙවැනි අය දිනෙන් දින තරබාරු වන බවටද හඳුනාගෙන ඇත.

මෙවැනි ග්‍රහ තත්ත්ව රාශියක් ජ්‍යොතිෂයේ සඳහන් කෙරෙන පාරම්පරික ජ්‍යොතිෂ සිද්ධාන්ත සහ රහස් අනුව සොයාගත් කරුණුවලින් පෙන්වා දිය හැකිය. මෙලෙස විවිධාකාර ග්‍රහ තත්ත්වයන් අනුව බැලීමේදී කාන්තාවන්ගෙන් විශාල පිරිසක් සහ පිරිමින්ගෙන් වැඩි කොටසක් මානසිකව පීඩා විඳින සිය ශරීරාංග සම්බන්ධ ප්‍රශ්න ග්‍රහ බලපෑම මත සිදුවූ ඒවා බව පැහැදිලි වෙයි.

ඒ අනුව වසර ගණනාවකට පෙර විසූ පුරාණ ඍෂිවරු රාජ රාජ මහාමාත්‍යාදීන්ට සහ රාජකීය අන්තඃපුර ළඳුන්ගේ මෙවැනි දහසක් ගැටලු සඳහා විස්මිත ග්‍රහ ප්‍රතිකර්ම හඳුන්වා දී තිබූ බවද ඉතිහාස කෘති ඇසුරේ පැහැදිලි වේ.

එම ප්‍රතිකර්ම තුළින් පෙර සඳහන් කළ ග්‍රහ අසුබතාවන්ගේ බල දුබල කර ඒ ඒ අයගේ ශරීරාංග යන්ගේ දුර්වලතා මගහරවා ආකර්ෂණීය බවක් ලබාගෙන ඇත.

එමෙන්ම වර්තමානයේ කාන්තාවන් මෙන්ම පිරිමින්ද සිය ශරීරාංග වර්ධනය කරගැනීමට විවිධ රසායනිකවල පිහිට පතා අසීරුතාවට පත්වන අයුරු දක්නට ලැබේ. එහෙත් අතීතයේ එවැනි කිසිදු ආපදාවකින් තොරව ඒ ඒ ග්‍රහ දුබලතා දුරු කිරීමට අදාළ පිළියම් කර ඉතා පහසුවෙන් පිරිපුන් හැඩකාර සිරුර ලබාගත් බවට පාරම්පරික පොතපතේ සඳහන් වෙයි.

එලෙස අතීතයේ භාවිත කළ ක්‍රමවේද අතර වඩාත් ප්‍රචලිත ක්‍රම කිහිපයක් මෙලෙස දැක්විය හැකිය.

■ අන්තඃපුර ළඳුන්ගේ පියයුරු වර්ධනයට සහ වැහැරීම වැළැක්වීමට ඒ ඒ ස්ත්‍රීන්ගේ උත්පත්ති ග්‍රහ තත්ත්වය පරීක්ෂා කර අවශ්‍ය කාරණාවට බලවත් කළ යුතු ග්‍රහයාට අයත් ස්තෝත්‍ර සහ මන්ත්‍ර භාවිත කර ශාකසාර තෙල් බලගන්වා ආලේපයට ගැනීම.

■ ග්‍රහ ආකර්ෂණ ස්තෝත්‍ර මගින් බලගැන්වූ යන්ත්‍ර හෝ මැණික් අදාළ ඉන්ද්‍රියන්ගේ ස්පර්ශ වන ලෙස පැළඳීම.

■ ග්‍රහ ආකර්ෂණ ස්තෝත්‍ර භාවිතයෙන් බලගැන්වූ තැවුම් පොට්ටනි භාවිතයෙන් තැවීම.

එලෙස භාවිත කළ ක්‍රමවේද කිහිපයකි. ඒ අනුව ඔබට එවැනි ශාරීරික අවශ්‍යතාවක් ඇත්නම් මුලින්ම ඉතා විශ්වාසවන්ත ලෙස කේන්දරය පරීක්ෂා කරගෙන දෝෂ හඳුනාගන්න. ඉන් පසු ඔබගේ ශරීරාංගයන්ගේ වර්ධනයට, වැහැරීමට බලපෑ ග්‍රහයන් හඳුනාගෙන සුදුසු ස්වභාවික තෙල් වර්ගයක් පහත මන්ත්‍රයන්ගෙ න් අවශ්‍ය මන්ත්‍රය තෝරාගෙන 1008 වරක් මතුරා බලගන්වා ගන්න. මෙය එලෙස තුන් වරුවක් බලගන්වා, ඉන් පසු එළඹෙන බදාදා දිනයේ හෝ සෙනසුරාදා දිනයේ සිට රාත්‍රියට ඔබ සාදාගත් තෙල් වර්ගය භාවිත කළ හැකිය. මෙම තෙල ඔබගේ නමට ලග්නයට වෙලාවටද බලගන්වාගත හැකි නම් ඉතා උසස් ප්‍රතිඵල ලැබේ.

*රවි ග්‍රහයාට - ඕං හ්‍රාං හ්‍රීං ද්‍රෑං සූර්යාය*
*සඳුට - ඕං ශ්‍රං ශ්‍රිං ශ්‍රෑං සඃ සෝමාය ස්වහඃ*
*කුජට - ඕං ක්‍රාං ක්‍රීං කෑං සඃ සෞමාස ස්වහඃ*
*බුධට - ඕං බ්‍රාං බ්‍රීං බ්‍රෑං සඃ බුධාය ස්වහඃ*
*ගුරුට - ඕං ඟදාං හද්‍රං ගස ගුරුවේ ස්වහඃ*
*සිකුරුට - ඕං අං ඊං ඌංස ශුක්‍රාය ස්වහඃ*
*ශනිට - ඕං ෂාං ෂිං ෂ්‍රං ස සනියේ ස්වහඃ*
*රාහුට - ඕං හ්‍රාං හ්‍රීං හ්‍රෑං ස රාහුවේ ස්වහඃ*
*කේතුට - ඕං කාලාං කිලිං කලුං ස කේතුවේ ස්වහඃ*

ඔබගේ අවශ්‍යතාව අනුව ඉතා සූක්ෂ්මව කේන්දරය පරීක්ෂා කර බලා කටයුතු කරගන්න. මේ සඳහා කේන්දරය ඔබට පරීක්ෂා ගරගත නොහැකි නම් අලස නොවන ජන්මියා ගැන සාධාරණව සිතන අවංක ජ්‍යොතිෂවේදියකුගෙන් කේන්දරය පරීක්ෂා කරවාගෙන අදාළ කටයුතු කරගන්න. මෙම ප්‍රතිකර්මය ඇරැඹි දිනට පසුදා සිටම ඔබට ප්‍රතිඵල පෙන්නුම් කරනු ඇත.

**ජ්‍යොතිෂ සහ වාස්තුවේදී**
**ජ්‍යොතිෂ පර්යේෂක**
**ජ්‍යොතිෂ පුවත්පත් රැසක හිටපු ප්‍රධාන කර්තෘ**
**ජේ.එන්.කේ. රත්නායක**
**0777579404**



# ලග්න රැසකට තීරණාත්මක වෙනස්කම්

**2026 ජූලි 12 වැනිදා සිට ජූලි 18 වැනිදා දක්වා රවි මිථුනයෙන් කටකයට යද්දී චන්ද්‍රයා වෘෂභ, මිථුන, කටක රාශි පසුකරයි**

2026 ජූලි මස 12 වැනි ඉරිදා සිට ඉදිරියට එළඹෙන දින හතක කාලය ග්‍රහ මණ්ඩලය තුළ සුවිශේෂ ග්‍රහ ගෝචරයන් කිහිපයක් සිදුවනු ඇති. ඒ අනුව රවි ග්‍රහයා කටක රාශියටත්, චන්ද්‍රයා රාශි තුනකටත් ගෝචර වීමට සූදානමින් සිටී. එසේම සතිය ආරම්භයේදී කුජ වෘෂභයේත්, බුධ මිථුනයේත්, ගුරු කටකයේත්, සිකුරු සිංහයේත්, ශනි මීනයේත්, රාහු කුම්භයේත්, සිංහයේත් ගෝචරව සිටී. මෙම ග්‍රහ තත්ත්වය අනුව විමසා බැලීමේදී මෙම සතිය තුළ රට තුළ යම් සාමකාමී ස්වරූපයක් නිර්මාණය වුවද ආන්දෝලනාත්මක කාරණා සම්බන්ධ තීන්දු තීරණ කතාබස් ඇතිවීමේ ඉඩක් පෙන්නුම් කෙරේ. එසේම හිතාමතා වැඩ නොකරන සහ දුරදිග නොසිතා වැඩ නොකිරීම නිසා සිදුවන හදිසි අනතුරු සම්බන්ධ පුවත් අසන්නට සිදුවිය හැකිය. ලෝකයේ විශේෂිත පුද්ගලයන් අපහසුතාවට පත්වීමටද ඉඩකඩ තිබේ. එසේම හදිසි අනතුරු, විපත් ඇතිවීමේ අවදානමක් ඇති බැවින් වැටෙන ගැටෙන අංශවල රාජකාරි කරන පිරිස් ප්‍රවේසම් විය යුතුය. මෙම ග්‍රහ තත්තවය යටතේ ලග්න වශයෙන් ගත් විට,

## මේෂ

### මුදල් සම්බන්ධ කතා

මිල මුදල්, ධන ලාභ ගැන කතාබස් ඇතිවනව අතර, ඇතැම් විට හදිසි මුදල් ලැබීමකට ඉඩ ඇත. කතාබහේදී ඉතා ප්‍රවේසම් විය යුතුය. කේළාම්, ඕපාදූප ආදිය නිසා අමනාපකම් ඇතිවීමට ඉඩ ඇත. මිතුරෙකු හෝ ඥාතියෙකු හදිසියේ ඔබ සොයා පැමිණේ. ගමන් බිමන්වලින් වාසි අත්වන සතියකි. ඔබේ ගුණ ගැන කතාබස් ඇතිවේ.

## වෘෂභ

### දියුණුවට තීරණ

අන් අය සමග කටයුතු ප්‍රවේසමෙන්. තම තත්ත්වයට නොගැළපෙන අයගෙන් චෝදනා එල්ල විය හැකි සතියකි. කෙසේ නමුත් සතිය මැදදී සියල්ල වෙනස් වන අතර, නොසිතූ ජයග්‍රහණ සහ විශේෂ වරප්‍රසාද ලැබෙනු ඇත. තමාගේ දියුණුවට හේතු වන තීන්දු තීරණ කිහිපයක් සති අගදී ගන්නට සිදුවේ. ඔබේ සිතේ කලක සිට තිබූ බලාපොරොත්තුවක් ඉටුවන බවට ඉඟි පළවන සතියකි.

## මිථුන

### සුබ ආරංචියක්

සිතට සහනය දැනෙන සතියකි. වෙනදාට වඩා ඔබ තුළින් ආකර්ෂණීය බවක් ඉස්මතු වේ. සිතට සතුට ගෙනදෙන ගමන් බිමන්වලටද ඉඩ තිබේ. හිතවතුන් සමග ප්‍රිය සාද යෙදෙනු ඇත. තනියම හුදෙකලාවී සිටින්නට සිතෙන සතියකි. නිවාස සම්බන්ධ කතාබස්, තරග විභාග ආදියෙන් වාසි අත්වනු ඇත. තම පවුලේ අයකු ගැන සුබ ආරංචියක් ලැබේ.

## කටක

### සතිය අගදී වාසියක්

මෙම සතියේ ආරම්භයේදීම නොදැනුවත්කමින් පාඩු සිදුවිය හැකි බැවින් ප්‍රවේසම් විය යුතුය. එසේම අතමිට ඇති මුදල් වියදම් වීමට ඉඩ තිබේ. අනවශ්‍ය වියදම්වලට මුදල් යෙදවීම සුබ නැත. ඥාතීන් සමග මත ගැටුම්වලට නොයා යුතුම සතියකි. අන් අයගේ යෝජනා අනුව වැඩ නොකළ යුතුය. සතිය අගභාග යේදී විශේෂ ආර්ථික වාසියකට හේතු යෙදේ. මෙතෙක් තමන්ට නොලැබුණු යමක් හිටිහැටියේ ලැබෙන ග්‍රහ තත්ත්වයක් ඇත.

## සිංහ

### අලුත් මිතුරන්

ඉතා වාසනාවන්ත සතියකි. මැදිවයස් ස්ත්‍රීන් සමග විශේෂ ගනුදෙනු සම්බන්ධතා ඇතිවේ. ලැබෙන්නට තිබූ මුදල් ලැබෙනු ඇත. අලුත් මිත්‍රයන් හඳුනාග න්නට ලැබෙන අතර, එමගින් විශේෂ ආර්ථික වාසිද අත්වේ. දුරබැහැරින් විශේෂ ඇරයුම් ලැබෙන්නට නියමිතය. කලක සිට බලාපොරොත්තුව සිටි දෙයක් ඉටුවේ.

## කන්‍යා

### දේපළ වාසි

පවුලේ අයගෙන් සහ හිතමිත්‍රයන්ගෙන් හොඳ අසන්නට ලැබෙන සතියකි. එමෙන්ම සිතේ සතුටට හේතු යෙදේ. නව ව්‍යාපාර සහ නව ඉදිකිරීම් සඳහා ඉතා යහපත් කාලයකි. ගමන් බිමන්වලදී විශේෂ මූල්‍ය ලාභ ඇතිවේ. උසස් සහ ප්‍රභූ පුද්ගලයන් සමග ආශ්‍රයටද, ගනුදෙනුවලටද ඉඩ ඇත. මවු පාර්ශ්වයෙන් විශේෂ ලැබීම් ඇති අතර, දේපළ හෝ ධනය ලැබීමක් ගැනද ආරංචි ලැබෙනු ඇත.

## තුලා

### ඇඳුම් ගැන කතාබස්

මේ සතියේ ඉතා කල්පනාකාරීව කටයුතු කළ යුතුය. නැතහොත් ඔබ නොකළ දේ සම්බන්ධ චෝදනාවලට ඉඩ ඇත. සතිය මැදදී මෙම තත්ත්වය වෙනස් වන අතර, ඇඳුම් පැලඳුම් සම්බන්ධ කතාබස්ද ඇතිවේ. එවැනි කතා දුරදිග යෑමෙන් අමනාපවීම් සිදුවීමටද ඉඩ ඇත. සතිය අගදී ලොතරැයි දිනුම් පෙන්වන අතර, තම තැන්පත් ධනය වර්ධනයටද අවස්ථා යෙදෙනු ඇත.

## වෘශ්චික

### රහස් ගමන්

ආහාර සම්බන්ධ සහ උදරය සම්බන්ධ කටයුතුවලට ගැටලු යෙදෙනු ඇත. තරමක් ප්‍රවේසමෙන් කටයුතු කිරීම ඉතා යහපත්ය. දණහිස්, තුණටිය, උදරය ආශ්‍රිත අපහසුතා දැනේ. අධික වියදම් යෙදෙන අතර, නොසිතූ හේතුවලින් සිත් රිදවීම් ඇතිවිය හැකිය. තම සැලසුම් යම් තරමකට වෙනස් කෙරෙන සතියකි. කෙසේ නමුත් මේ සතියේ රහස් ගමනකට හේතු යෙදේ.

## ධනු

### ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා

වෙනදාට වඩා සැප පහසුවට අවශ්‍ය දේ ලැබෙනු ඇත. නිවාස අලුත්වැඩියාවට, විශේෂ ගමන් බිමන්වලට, නව ව්‍යාපාර ආරම්භයට ඉතා සුබ සතියකි. ස්ත්‍රී පුරුෂ නව සබඳතා ගොඩනැගෙන අතර, පවුලට සම්බන්ධ එවන් අයකුගෙන් විශේෂ ආරාධනාවක් ලැබේ. රහස් සම්බන්ධතා සඳහා අවස්ථා යෙදෙනු ඇත. එමෙන්ම සතිය අගදී වාහන සම්බන්ධ බලාපොරොත්තුවක් ඉටුවේ.

## මකර

### බලාපොරොත්තු ඉටුවේ

වියදම් අධික වන අතර, දුර ගමනකට හේතු යෙදේ. තම ව්‍යාපාර සැලසුම්, රැකියා සහ තනතුරු ගැන කතාබස් යටපත් වුවද සතිය අගදී නොසිතූ ආකාරයේ ධන වාසනාවකට හේතු යෙදේ. අලුතින් ව්‍යාපාර ආරම්භයට ඉතා හොඳ වටපිටාවක් සති අගදී යෙදෙන අතර, ඉන් දීර්ඝකාලීන ලාභයකට මගපෑදේ. මෙතෙක් කලක් ඔබ බලාපොරොත්තුවෙන් සිටි දෙයක් ඉටුවනු ඇත.

## කුම්භ

### හිතවතුන්ගෙන් උදව්

ඔබ සොයා අමුත්තන් පැමිණෙන සතියකි. ඇතැම් විට විදෙස්ගත මිතුරන්ගේ පැමිණීමක් සිදුවනු ඇත. අලුත් ඇඳුම් තෑගි ලැබේ. ව්‍යාපාර කරන අයට නව ආයෝජන අවස්ථා උදාවන අතර, රැකියා කරන අයට තනතුරු උසස්වීම් යෙදේ. ස්ත්‍රී පාර්ශ්වයෙන් විවිධ යෝජනා ලැබේ. හිතවත් අයගේ උදව් ගත හැකි හොඳ සතියකි.

## මීන

### බාධා මගහැරේ

බලාපොරොත්තු කිහිපයක් ඉටුවන බවට ඉඟි පළවේ. ගමන් බිමන්වලින් වාසි සහ ලාභ ලබාගත හැකිය. විශේෂ ප්‍රභූ පුද්ගලයන් හමුවීමට අවස්ථා යෙදෙන අතර, ඉන් නොසිතූ වාසිද අත්වේ. ජීවිතයේ සුවිශේෂ වෙනස්කම් ද සකට යෙහ්තු යෙදෙන අතර, මහා ධන සම්පතකට මගපෑදෙනු ඇත. මෙතෙක් කලක් පැවැති බාධා මගහැරී යන සතියකි.

**ජ්‍යොතිෂ සහ වාස්තුවේදී
ජ්‍යොතිෂ පර්යේෂක
ජ්‍යොතිෂ පුවත්පත් රැසක
හිටපු ප්‍රධාන කර්තෘ
ජේ.එන්.කේ. රත්නායක
0777579404**